257864

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1995 අංක 4 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 පෙබරවාරි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි.

# 1995 අංක 4 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 පෙබරවාරි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 2/92

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1995 අංක 4 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1979 අංක 15 දරන පනතේ 291 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(4) (අ) දඩයක් ගෙවීම සඳහා පමණක් ද, දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට බන්ධනාගාරගත කිරීම සඳහා ද, වරදකරුවකුට දණ්ඩන නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දඩය වශයෙන් අයවිය යුතු මුළු මුදල වරදකරු විසින් සම්පූර්ණයෙන් එක්වරම ගෙවනු ලබන අවස්ථාවක දී හැර, පහත දැක්වෙන සියලු දේ හෝ ඉන් කිසිවක් හෝ අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය:—

(i) එකී දඩය ගෙවීම සඳහා කල් දීම;

(ii) එකී දඩය වාරික මගින් ගෙවීමට විධාන කිරීම;

(iii) එකී දඩය හෝ යම් වාරිකයක් ගෙවීම සඳහා ඇපකරුවකු හෝ ඇපකරුවන් හෝ ඇතිව හෝ නැතිව, අදාළ නියමිත ආකෘති පත්‍රය මගින්, අධිකරණය සෑහීමට පත්වන අන්දමේ බැඳුම්කරයකට ඇතුළුවීමට එකී දඩය ගෙවීමට යටත් වන තැනැත්තාට නිදහස ඇති බව විධාන කිරීම, තව ද මේ සංග්‍රහයෙන් විධිවිධාන සලසා ඇති ආකාරයෙන් ඒ බැඳුම්කරයට ඇතුළුවීම හා ඒ බැඳුම්කරය ක්‍රියාවෙහි යෙදවීම හෝ කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, දඩයක් ගෙවීම සඳහා පමණක් ද, දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට බන්ධනාගාරගත කිරීම සඳහා ද, දණ්ඩන නියමයක් කරනු ලැබ ඇති වරදකරුවකු සම්බන්ධයෙන් අධිකරණය විසින් (i), (ii) සහ (iii) වන අනුඡේදවල නිශ්චිතව සඳහන් කර ඇති සියළු දේ හෝ ඉන් කිසිවක් හෝ කරනු ලැබ ඇති අවස්ථාවක, අසාමාන්‍ය අවස්ථාගත කරුණුවල දී සහ වාර්තාගත කරනු ලැබිය යුතු හේතු සඳහා හැර, ඒ වරදකරු විසින් ඒ වරද සම්බන්ධයෙන්ම පසුව කරනු ලබන පැහැර හැරීමක් ඇති වූ විටක දී ඒ වරදකරු සම්බන්ධයෙන් ම ඒ අනුඡේදවල නිශ්චිතව සඳහන් දේ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ අධිකරණය විසින් නොකළ යුතු ය.

(ආ) මේ උපවගන්තිය බලාත්මක වන දිනයේ දී යම් තැනැත්තකු දඩයක් ගෙවීම පැහැර හැරීම වෙනුවෙන් බන්ධනාගාරගත වීමේ කාලසීමාවක් ගෙවමින් සිටින අවස්ථාවක, (අ) ඡේදයට අනුකූලව පියවර ගැනීම සඳහා, ඒ තැනැත්තාට දණ්ඩන නියමය කරන

ලද්දේ යම් අධිකරණයක් විසින් ද ඒ අධිකරණය හමුවට ඒ තැනැත්තා ඉදිරිපත් කිරීම ඒ තැනැත්තා තම දණ්ඩනය ගෙවමින් සිටින බන්ධනාගාරයේ අධිකාරීවරයාගේ කාර්යය විය යුතු ය.

(ඇ) (අ) ඡේදයේ (i) වන හෝ (ii) වන අනුඡේදය යටතේ යම් ගෙවීමක් කිරීමට ඇති අවස්ථාවක, යම් අනුමත කළ බැංකුවකට හෝ යම් ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කාර්යාලයකට හෝ තැපැල් කාර්යාලයකට ඒ ගෙවීම කිරීමට විධාන කරන අධිකරණය විසින් නිශ්චිත වශයෙන් නියම කළ කාලය ඇතුළත, ගෙවීම කරනු ලැබිය යුතු ය. තවද, මේ කාර්ය සඳහා, ඒ ගෙවීම් කරන විට, ඒ බැංකුවට, යම් ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කාර්යාලයට හෝ තැපැල් කාර්යාලයට වරදකරු විසින් ඉදිරිපත් කිරීම පිණිස, දඩයේ ප්‍රමාණය, එක් එක් වාරිකයේ ප්‍රමාණය, දඩය ගෙවිය යුතු වාරික ගණන සහ වෙනත් අදාල විස්තර සඳහන් කරමින් නියමිත ආකෘතියේ වූ ප්‍රකාශයක් අධිකරණය විසින් වරදකරුට නිකුත් කරනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ඒ දඩය හෝ වාරිකය ගෙවීම භාර ගැනීමෙන් පසු ඒ බැංකුව, ප්‍රාදේශීය ලේකම් හෝ ඒ තැපැල් කාර්යාලයේ තැපැල් ස්ථානාධිපතිවරයා විසින්, ඒ ප්‍රකාශයේ ඒ බවට පිටසනක් කොට ඒ ප්‍රකාශය වරදකරුට ආපසු භාරදිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ දඩය හෝ වාරිකය ගෙවූ බවට ඔප්පු කිරීම, නියමිත ආකෘතිය මගින්, ඒ ගෙවීම් කිරීම විධාන කරනු ලැබූ අධිකරණය වෙත ඒ ගෙවීම භාර සති දෙකක් ඉකුත් වීමට ප්‍රථමයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) මේ උපවගන්තියේ "අනුමත කළ බැංකුව" යන්නෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල වූ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ අගට පහත දැක්වෙන අලුත් ආකෘති පත්‍ර එකතු කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"අංක 19

දඩය ගෙවීම සඳහා (ඇපකරුවන් නොමැතිව) දිය යුතු බැඳුම්කරුගේ ආකෘතිය

[291 (4) වන වගන්තිය]

19............ ක් වූ ............ මස ............ වන දින දී ය.

............ පදිංචි ......... (වරදකරුගේ නම සහ ලිපිනය) ........... වන මම අංක ............ දරන නඩුව සම්බන්ධයෙන් ම විසින් දඩය වශයෙන් ගෙවිය යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලැබූ රුපියල් ............ ක මුදල අධිකරණයට ගෙවීමට මෙයින් භාරයේ බන්ධනය මෙමි.

එකී බැඳුම්කරයේ කොන්දේසිය නම්, එකී................... (වරදකරුගේ නම) වන මා විසින් මාස......... කාලයක් තුළ දී රු. ......... බැගින් වාරික ......... කින් එකී දඩ මුදල ............ ට (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බැංකුව හෝ තැපැල් කාර්යාලය) ගෙවුවහොත් එකී බැඳුම්කරයෙන් මා නිදහස් කරනු ලැබිය යුතු අතර එසේ ගෙවීම නොකලහොත් මාගේ පැහැර හැරීම වෙනුවෙන් බන්ධනාගාරගත විය යුතු කාලසීමාව ගෙවීම පිණිස මා සිරභාරයට ගනු ලැබිය යුතු බවය.

මේ බැඳුම්කරය යටතේ මා නිදහස් කරනු ලැබූ විට, නොතිසි ආදිය මා වෙත එවිය යුතු ලිපිනය මෙසේ ය:—

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

අත්සන් කලේ ..............
වරදකරු.

දිනය :............

19......... ක්වූ......... මස ......... වන දින මා ඉදිරිපිට දී මෙම බැඳුම්කරයට ඇතුලත් වී පිළිගන්නා ලදී.

අත්සන් කලේ ............
රෙජිස්ට්‍රාර්.

අංක 20

දඩය ගෙවීම සඳහා (ඇපකරුවන් සහිතව) දිය යුතු බැඳුම්කරයේ ආකෘතිය

[291 (4) වන වගන්තිය]

19............ ක්වූ ............ මස ............ වන දින දී ය.

............... පදිංචි ............... (වරදකරුගේ රැකියාව නම සහ ලිපිනය) වන මම ප්‍රධාන ණයකරු වශයෙන් ද සහ .................. පදිංචි .................. (ඇපකරුගේ/ඇපකරුවන්ගේ නම, රැකියාව සහ ලිපිනය) වන මම/අපි ඇපකරු/ඇපකරුවන් වශයෙන් ද අංක........... දරන නඩුව සම්බන්ධයෙන්......... (වරදකරුගේ නම) විසින් දඩය වශයෙන් ගෙවිය යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලැබූ රුපියල් . ..... ක මුදල අධිකරණයට ගෙවීමට එක්ව සහ වෙන් වෙන්ව මෙයින් බන්ධනය වෙමු.

එකී බැඳුම්කරයේ කොන්දේසිය නම් එකී වරදකරු ප්‍රධාන ණයකරු වශයෙන් රු. ............ ක් වූ දඩය මාස ............ කාලයක් තුළ දී රු. ............ බැගින් වාරික ......... කින් ............ ට (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බැංකුව හෝ තැපැල් කාර්යාලය) ගෙවිය යුතු බවය.

ඉහත දැක්වෙන කොන්දේසිය පරිදි එකී මුදල වරදකරු විසින් නොගෙවුවහොත් මෙහි නම් සඳහන් කරන ලද ............... (ඇපකරුගේ/ඇපකරුවන්ගේ) නම් වන මම/අපි එකී දඩ මුදල ගෙවීමට මෙයින් පුද්ගලිකව ම භාරගනිමි/ගනිමු.

අත්සන් කලේ ............
වරදකරු

....................
ඇපකරු/ඇපකරුවන්

දිනය. ...............

19......... ක්වූ ............ මස ............ වන දින මා ඉදිරිපිට දී මෙම බැඳුම්කරයට ඇතුලත් වී පිළිගන්නා ලදී.

අත්සන් කලේ ............
රෙජිස්ට්‍රාර්.

# 1995 අංක 4 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

## අංක 21

### වරදකරුට නිකුත් කළ යුතු ප්‍රකාශය

[291 (4) වන වගන්තිය]

නඩු අංකය : ..................

.................. පවත්වන ලද මහාධිකරණයේ දී.

.................. මහෙස්ත්‍රාත් අධිකරණයේ දී.

.................. ප්‍රාථමික අධිකරණයේ දී.

ඉහත සඳහන් කරන ලද නඩුවේ දී මහාධිකරණයේ විනිශ්චයකාරවරයා/ මහෙස්ත්‍රාත්වරයා /ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද/කරන ලද නඩු තීන්දුව/ආඥාව මගින්, ............... (වරදකරුගේ නම සහ ලිපිනය) වන ඔබට රුපියල් .... ...... ක දඩයක් සහ ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් බන්ධනාගාරගත කිරීමක දණ්ඩන නියමයක් ඇත.

මේ ප්‍රකාශය ........... බැංකුවට, යම් ප්‍රාදේශීය ලේකම්වරයකුගේ කාර්යාලයකට හෝ තැපැල් කාර්යාලයකට ඉදිරිපත් කරන ලෙසත්, එකක් රු............ක් වූ වාරික ............... කින් ............... දිනට හෝ ඊට පූර්වයෙන් ඔබ වෙත පනවන ලද දඩය ඒ බැංකුවට, ප්‍රාදේශීය ලේකම්වරයාගේ කාර්යාලයට හෝ තැපැල් කාර්යාලයට ගෙවන ලෙසත් අධිකරණය විසින් ඔබට මෙයින් නියම කරනු ලැබේ. (ඊළඟට එළඹෙන වාරික ගෙවීමට ඔබට හැකිවනු පිණිස, දඩය හෝ වාරිකය ගෙවීමෙන් පසු මෙම ප්‍රකාශය බැංකුව, ප්‍රාදේශීය ලේකම් හෝ තැපැල් ස්ථානාධිපතිවරයා විසින් ඔබට ආපසු දෙනු ඇත.)

අධිකරණයේ අණ පරිදි,

............... ... ...

රෙජිස්ට්‍රාර්.

## අංක 22

### ගෙවීම් කළ බව ඔප්පු කිරීම සම්බන්ධයෙන් වූ ආකෘතිය

[291 (4) වන වගන්තිය]

නඩු අංකය : ............

............ අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත :

අංක ......... ... දරන නඩුව සම්බන්ධයෙන් අධිකරණය විසින් ඔහුට ගෙවීමට නියම කරනු ලැබ ඇති දඩය/වාරිකය ගෙවීම වශයෙන් රු. .............. ක මුදලක් .............. දින ........... (වරදකරුගේ නම සහ ලිපිනය) ගෙන් භාරගන්නා ලදී.

අත්සන් කළේ ...........

බැංකු කළමනාකරු/ප්‍රාදේශීය ලේකම්/තැපැල් ස්ථානාධිපති.

දිනය :......................".

(මුද්‍රාව)

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.